රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක :- 02/2015

මගේ අංකය:- සීඑස්/වී/එස්එම්/ඩී/2009
රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා
ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2015.03.25

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්/ ප්‍රාදේශීය ලේකම්වරුන් සහ
රාජ්‍ය ආයතන ප්‍රධානීන් වෙත.

<u>ඒකාබද්ධ රියදුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය ක්‍රියාත්මක කිරීම</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1999.10.13 දිනැතිව අංක 1101/9 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1999 ඔක්තෝබර් 06 දින දරන ඒකාබද්ධ රියදුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය වෙනුවට 2014.08.15 දිනැතිව අංක 1875/39 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නව ඒකාබද්ධ රියදුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය 2013.07.01 දින සිට ක්‍රියාත්මක වේ.

**02. අන්තර්ග්‍රහණය**

ව්‍යවස්ථා සංග්‍රහයේ 13 වගන්තියේ සඳහන් විධි විධාන ප්‍රකාරව,
සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින සේවකයන් සියලුදෙනාම ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 4 වන වගන්තියේ විධිවිධාන අනුව පහත සඳහන් කොන්දේසි වලට යටත්ව නව ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

I. අන්තර්ග්‍රහණය හේතුවෙන් වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවන අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක වේ.
II. එසේම අනුරූපී වැටුප් පියවරක් හිමි වීම හේතු කොට ගෙන ඊළඟ ඉහළ වැටුප් පියවරෙහි තබනු නොලැබේ.

ඒ අනුව,

I. II "ආ" පන්තියේ සේවකයන් III ශ්‍රේණියට,

II. II "අ" පන්තියේ සේවකයන් II ශ්‍රේණියට,

III. I පන්තියේ සේවකයින් I ශ්‍රේණියට,

IV. I පන්තියේ යටත් පිරිසෙයින් වසර නවය (09) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා වැටුප් වර්ධක නවය (09) ක් උපයාගෙන ඇති සහ අනෙකුත් සේවා අවශ්‍යතා සම්පූර්ණ කර ඇති සේවකයින් විශේෂ ශ්‍රේණියට,

ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන 2013.07.01 දින සිට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

**සටහන 1**

I පන්තියේ සිට විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම සඳහා අයදුම්පත්‍ර අංක 04 න් දැක්වෙන ආකෘති පත්‍රය අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානියා/ අමාත්‍යාංශ ලේකම් විසින් නිර්දේශ කර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය.

## 03. බඳවා ගැනීම්

ව්‍යවස්ථාවේ 7 වගන්තිය අනුව අදාළ අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශය පරිදි ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබේ. ඒ අනුව පුරප්පාඩු ඇති වූ විට අනුමත තනතුරු සංඛ්‍යාව, දැනට සේවයේ සිටින සංඛ්‍යාව, පුරප්පාඩු සංඛ්‍යාව සමඟ පහත සඳහන් පරිදි ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කළ යුතුය.

අ. විශ්‍රාම ගැන්වීම, සේවයෙන් ඉල්ලා අස්වීම, මියයෑම හෝ සේවය අතහැර යාම නිසා ඇති වූ පුරප්පාඩු සඳහා එම නිලධාරියාගේ නම හා ශ්‍රේණිය ද, පුරප්පාඩු ප්‍රමාණය හා ඇති වූ ආකාරය සඳහන් කළ යුතුය.

ආ. ඉහත අ වගන්තියෙහි සඳහන් හේතුන් වලින් බැහැරව ඇති වූ පුරප්පාඩු වෙනුවෙන් එම පුරප්පාඩු ප්‍රමාණය හා ඇති වූ ආකාරය ද සඳහන් කර පුරප්පාඩු පිරවීම සඳහා කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගත යුතු අතර, එම අනුමැතීන් වල සහතික කරන ලද පිටපත් ද, ඒ සමඟ ඉදිරිපත් කළ යුතුය.

## 04. උසස් වීම්

2013.07.01 දින සිට ඒකාබද්ධ රියදුරු සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 10 වගන්තිය යටතේ දැක්වෙන උසස්වීම් පරිපාටිය අනුව සිදු කරනු ලැබේ.

එක් එක් ශ්‍රේණි වලට උසස් කිරීම සඳහා පහත දැක්වෙන ආකෘතිපත්‍ර අනුව උසස්වීම් අයදුම්පත් සම්පූර්ණ කර දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හා අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කළ යුතුය.

I. III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය යටතේ උසස් කිරීම සඳහා අයදුම්පත්‍ර අංක 01

II. II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය යටතේ උසස් කිරීම සඳහා අයදුම්පත්‍ර අංක 02

III. I ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත්‍ර අංක 03

IV. I ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය සඳහා අයදුම්පත්‍ර අංක 04

**සටහන 2**

2013.07.01 දිනට I පන්තියේ වසර 09ක සේවා කාලයක් සපුරා ඇති නිලධාරීන් විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම සඳහා අයදුම් පත්‍ර අංක 04 භාවිත කළ යුතු වේ.

**සටහන 3**

2013.07.01 දිනට II 'අ' පන්තියේ වසර 09ක සේවා කාලයක් සපුරා ඇති නිලධාරීන් I ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම් පත්‍ර අංක 02 භාවිත කළ යුතු වේ.

**05. කාර්යක්ෂමතා කඩඉම්**

ව්‍යවස්ථාවේ 8 වන වගන්තිය යටතේ දැක්වෙන විධි විධාන ප්‍රකාරව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පැවැත්විය යුතු වේ.

අ. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්බන්ධ බලධරයා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වන අතර, පහත සඳහන් කර ඇති නිලධාරීන්ගෙන් සමන්විත, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් අදාළ පරීක්ෂණය පැවැත්විය යුතුය.

1. අදාළ නිලධාරීන් සේවය කරනු ලබන දෙපාර්තමේන්තුවේ විධායක මට්ටමේ නිලධාරියෙකු සභාපති ලෙස
2. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මෝටර් රථ පරීක්ෂකවරයකු
3. පොලිස් රථවාහන අංශයේ නිලධාරියෙකු

ආ. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය නිර්දේශ කර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගත යුතුය.

**06. වෙනත්**

ඒකාබද්ධ රියදුරු සේවයේ නිලධරයන් නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ හා ව්‍යවස්ථාවේ 09 වගන්තිය ප්‍රකාරව රාජ්‍ය භාෂාව හා අනෙක් රාජ්‍ය භාෂාව අදාළ ප්‍රවීණතා පරීක්ෂණය වලින් සමත්විය යුතුවේ.

**සටහන 4**

2007.07.01 දිනට පසුව ඒකාබද්ධ රියදුරු සේවයට බඳවා ගත් නිලධාරීන් පමණක් පත්වීම් දින සිට වසර 05ක් ඇතුළත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 1/2014 හි විධි විධාන අනුව අදාළ රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

අ. සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට පැරණි සේවා ව්‍යවස්ථාව යටතේ I පන්තියට උසස් වී සිටින නිලධරයන් I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කෙරේ.

ආ. දැනට සේවයේ යෙදී සිටින නිලධාරීන් සම්බන්ධයෙන් ව්‍යවස්ථාවේ විධිවිධාන අනුකූල වීමට ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දින සිට වසර තුන (03) ක සහන කාලයක් දෙනු ලැබේ.

ජේ. දඩල්ලගේ
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය

**අයදුම්පත්‍ර 01**

**ඒකාබද්ධ රියදුරු සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් II ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය මත උසස් කිරීම සඳහා වූ ආදර්ශ අයදුම් පත්‍රය**

**I කොටස (නිලධාරියා විසින්ම සම්පූර්ණ කල යුතුය)**

1. මුලකුරු සමග නම :- ..........................................................................................
2. මුලකුරු වලින් හැඳින්වෙන නම :-.......................................................................................
3. දැනට සේවය කරන කාර්යාලය :- ..........................................................................................
4. සේවයට ඇතුලත් වූ දිනය :- ....................................................
5. ඒකාබද්ධ සේවයේ පත්වීම් ලිපියේ අංකය :- ....................................................
6. පත්වීම ස්ථිර කල දිනය :- .....................................................
7. කාර්යක්ෂමතා කඩඉම සමත් වූ දිනය :- .....................................................
8. තුන්වන මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ලබා ගන්නා ලද දිනය :- ..........................................
9. සේවයේ වසර දහය සම්පූර්ණ කල දිනය :- ....................................................

මා විසින් ඉහත සඳහන් කර ඇති සියලුම තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි .

දිනය :- ................................... .......................................

අයදුම්කරුගේ අත්සන

---

**II කොටස**

**අමාත්‍යාංශ ලේකම් /දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

.........................................................................................................මහතා මෙම කාර්යාලයේ සේවය කරන අතර, ඉහත වාර්තා කර ඇති කරුණු ඔහුගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව නිවැරදිය.

1. පත්වීම ස්ථිර කරන ලද දිනය :- ...................................
2. III වන ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වූ දිනය :- .........................................
3. තුන්වන මට්ටමේ අනෙකුත් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගන්නා ලද දිනය :- ...........................
4. III ශ්‍රේණියේ වසර 10ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කරන ලද දිනය :- ...........................
5. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර 10ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර ඇත/ නැත
6. එදිනට පූර්වාසන්න වසර 10 තුළ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇත / නැත
7. I. එදිනට පූර්වාසන්න වසර 10 තුළ අඩ වැටුප් සහ වැටුප් රහිත නිවාඩු ලබා ගෙන ඇත /නැත

   II. වැටුප් රහිත හා අඩ වැටුප් සහිත නිවාඩු ලබා ගෙන තිබේනම්, ලබා ගත් නිවාඩු ප්‍රමාණය හා ලබා ගන්නා ලද දිනයන්.........................................................................................
8. I. එම කාලය තුළ නිලධාරයා යම් විනයානුකූල දඬුවමකට (අවවාද කිරීමක් හැර) ලක්වී තිබේද? ............................................................................................

   II. විනය ක්‍රියාමාර්ගයක් හෝ අධිකරණ ක්‍රියා මාර්ගයක් පිළිබඳ කටයුතු කරමින් පවතීද? ..............................................................
9. සංස්ථාවක හෝ වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය සඳහා නිලධාරියා මුදාහැර සිටීනම් අදාල කාල වකවානුව පිළිබඳ විස්තර :- ..........................................................................

   ........................................................................................................................................

මෙම නිලධාරියා සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇත / නැත. එබැවින් ..................... දින සිට II වන ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි. / නොකරමි.

දිනය : ...........................................

ආයතන ප්‍රධානියාගේ අත්සන :

නම :

පදවි නාමය :

(නිල මුද්‍රාව)

සටහන : ඉහත 1 සිට 9 දක්වා සුදුසුකම් සපුරා නොමැති නම් ඒවා සඳහන් කර එවන්න.

II වන ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි. / නොකරමි.

දිනය : ...........................................

අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන :

නම :

පදවි නාමය(නිල මුද්‍රාව) :

---

**අයදුම්පත්‍ර 02**

**ඒකාබද්ධ රියදුරු සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් I ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය මත උසස් කිරීම සඳහා වූ අයදුම් පත්‍රය**

**I කොටස - (නිලධාරියා විසින්ම සම්පූර්ණ කල යුතුය)**

1. මුලකුරු සමග නම :- ..........................................................................................
2. මුලකුරු වලින් හැඳින්වෙන නම් :-............................................................................................
3. දැනට සේවය කරන කාර්යාලය :- ............................................................................
4. සේවයට ඇතුලත් වූ දිනය :- ...............................................
5. ඒකාබද්ධ සේවයේ පත්වීම් ලිපියේ අංකය :- ....................................................
6. පත්වීම ස්ථිර කල දිනය :- ....................................................
7. දෙවන කාර්යක්ෂමතා කඩඉම සමත් වූ දිනය :-.....................................................
8. II ශ්‍රේණියේ / II ‘අ’ පන්තියේ සේවයේ වසර නවය සම්පූර්ණ කල දිනය :-.......................................

මා විසින් ඉහත සඳහන් කර ඇති සියලුම තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි .

දිනය : ...........................................

...................................

අයදුම්කරුගේ අත්සන

---

**II කොටස**

**අමාත්‍යාංශ ලේකම් /දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

.....................................................................................................මහතා මෙම කාර්යාලයේ සේවය කරන අතර, ඉහත වාර්තා කර ඇති කරුණු ඔහුගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව නිවැරදිය.

1. II ශ්‍රේණියට උසස් කරන ලද දිනය :- ..............................................
2. දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වූ දිනය :- ........................................
3. II ශ්‍රේණියේ වසර 09ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කරන ලද දිනය :- ...................
4. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර 09ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර ඇත/ නැත
5. එදිනට පූර්වාසන්න වසර 09 තුළ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇත / නැත

6. I. එදිනට පූර්වාසන්න වසර 09 තුළ අඩ වැටුප් සහ වැටුප් රහිත නිවාඩු ලබා ගෙන ඇත / නැත

II. වැටුප් රහිත හා අඩ වැටුප් සහිත නිවාඩු ලබා ගෙන තිබේනම්, ලබා ගත් නිවාඩු ප්‍රමාණය හා ලබා ගන්නා ලද දිනයන් ....................................................................

(රියදුරු සේවයේ II වන ශ්‍රේණියට පත් කල /උසස් කල දින සිට)

7. I. එම කාලය තුළ නිලධාරයා යම් විනයානුකූල දඬුවමකට (අවවාද කිරීමක් හැර) ලක්වී තිබේද? ....................................................................................................

II. විනය ක්‍රියාමාර්ගයක් හෝ අධිකරණ ක්‍රියා මාර්ගයක් පිළිබඳ කටයුතු කරමින් පවතීද? ...........................................

8. සංස්ථාවක හෝ වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය සඳහා නිලධාරියා මුදාහැර සිටීනම් අදාල කාල වකවානුව පිළිබඳ විස්තර :- ..........................................................................
..............................................................................................................................

මෙම නිලධාරියා සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇත / නැත. එබැවින් ..................... දින සිට I වන ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි. / නොකරමි.

දිනය : ...........................................  ආයතන ප්‍රධානියාගේ අත්සන :

නම :

පදවි නාමය(නිල මුද්‍රාව) :

සටහන : ඉහත 1 සිට 8 දක්වා සුදුසුකම් සපුරා නොමැති නම් ඒවා සඳහන් කර එවන්න.

I වන ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි. / නොකරමි.

දිනය : ...........................................  අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන :

නම :

පදවි නාමය (නිල මුද්‍රාව):

---

**අයදුම්පත්‍ර 03**

**ඒකාබද්ධ රියදුරු සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට**

**උසස් කිරීම සඳහා වූ අයදුම් පත්‍රය**

**I කොටස - (නිලධාරියා විසින්ම සම්පූර්ණ කල යුතුය)**

1. මුලකුරු සමග නම :- ..........................................................................................
2. මුලකුරු වලින් හැඳින්වෙන නම :-.........................................................................
3. දැනට සේවය කරන කාර්යාලය :- ...........................................................................
4. සේවයට ඇතුලත් වූ දිනය :- ...................................................
5. ඒකාබද්ධ සේවයේ පත්වීම් ලිපියේ අංකය :- ...................................................
6. පත්වීම ස්ථිර කල දිනය :- ....................................................
7. තුන්වන කාර්යක්ෂමතා කඩඉම සමත් වූ දිනය :- ...................................................
8. I ශ්‍රේණියේ සේවයේ වසර නවය සම්පූර්ණ කල දිනය :- ...................................................

මා විසින් ඉහත සඳහන් කර ඇති සියලුම තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි .

දිනය :- ..................................  ...........................................

අයදුම්කරුගේ අත්සන

**II කොටස**

**අමාත්‍යාංශ ලේකම් /දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

.....................................................................................................මහතා මෙම කාර්යාලයේ සේවය කරන අතර, ඉහත වාර්තා කර ඇති කරුණු ඔහුගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව නිවැරදිය.

1. I ශ්‍රේණියට උසස් කරන ලද දිනය :- ..............................................
2. තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වූ දිනය :- ...................................................
3. I ශ්‍රේණියේ වසර 09ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කරන ලද දිනය :- .............................
4. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර 09ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර ඇත/ නැත
5. එදිනට පූර්වාසන්න වසර 09 තුළ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇත / නැත
6. I. එදිනට පූර්වාසන්න වසර 09 තුළ අඩ වැටුප් සහ වැටුප් රහිත නිවාඩු ලබා ගෙන ඇත / නැත

   II. වැටුප් රහිත හා අඩ වැටුප් සහිත නිවාඩු ලබා ගෙන තිබේනම්, ලබා ගත් නිවාඩු ප්‍රමාණය හා ලබා ගත්තා ලද දිනයන් .........................................................

   (රියදුරු සේවයේ I වන ශ්‍රේණියට උසස් කල දින සිට)
7. I. එම කාලය තුළ නිලධාරයා යම් විනයානුකූල දඬුවමකට (අවවාද කිරීමක් හැර) ලක්වී තිබේද? ..............................................................................................

   II. විනය ක්‍රියාමාර්ගයක් හෝ අධිකරණ ක්‍රියා මාර්ගයක් පිළිබඳ කටයුතු කරමින් පවතීද? ...........................................
8. සංස්ථාවක හෝ වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය සඳහා නිලධාරියා මුදාහැර සිටීනම් අදාල කාල වකවානුව පිළිබඳ විස්තර :- ..............................................................................
   ..................................................................................................................................

මෙම නිලධාරියා සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇත / නැත. එබැවින් ..................... දින සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි. / නොකරමි.

දිනය : ..........................................

ආයතන ප්‍රධානියාගේ අත්සන :

නම :

පදවි නාමය(නිල මුද්‍රාව) :

සටහන : ඉහත 1 සිට 8 දක්වා සුදුසුකම් සපුරා නොමැති නම් ඒවා සඳහන් කර එවන්න.

විශේෂ ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි. / නොකරමි.

දිනය : ..........................................

අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන :

නම :

පදවි නාමය(නිල මුද්‍රාව) :

---

**අයදුම්පත්‍ර 04**

**2013.07.01 දිනට ඒකාබද්ධ රියදුරු සේවයේ I ශ්‍රේණියේ වසර 09ක සේවා කාලයක් සපුරා ඇති නිලධාරින් විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම සඳහා වූ අයදුම් පත්‍රය**

**I කොටස - (නිලධාරියා විසින්ම සම්පූර්ණ කල යුතුය)**

1. මුලකුරු සමග නම :- ......................................................................................
2. මුලකුරු වලින් හැඳින්වෙන නම් :-........................................................................
3. දැනට සේවය කරන කාර්යාලය :- ..........................................................................
4. සේවයට ඇතුලත් වූ දිනය :- ....................................................

5. ඒකාබද්ධ සේවයේ පත්වීම් ලිපියේ අංකය :- ....................................................

6. පත්වීම ස්ථිර කල දිනය :- ....................................................

7. I පන්තියේ සේවයේ වසර නවය සම්පූර්ණ කල දිනය :- ....................................................

මා විසින් ඉහත සඳහන් කර ඇති සියලුම තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි .

දිනය :- ........................................ ...........................................

අයදුම්කරුගේ අත්සන

---

**II කොටස**

**අමාත්‍යාංශ ලේකම් /දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

..........................................................................................................මහතා මෙම කාර්යාලයේ සේවය කරන අතර, ඉහත වාර්තා කර ඇති කරුණු ඔහුගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව නිවැරදිය.

1. I ශ්‍රේණියට උසස් කරන ලද දිනය :- ...............................................
2. 2013.07.01දිනට රියදුරු සේවයේ I ශ්‍රේණියේ වසර 09ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇත / නැත
3. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර 09ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර ඇත/ නැත
4. එදිනට පූර්වාසන්න වසර 09 තුළ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇත / නැත
5. I. එදිනට පූර්වාසන්න වසර 09 තුළ අඩ වැටුප් සහ වැටුප් රහිත නිවාඩු ලබා ගෙන ඇත /නැත

   II. වැටුප් රහිත හා අඩ වැටුප් සහිත නිවාඩු ලබා ගෙන තිබේනම්, ලබා ගත් නිවාඩු ප්‍රමාණය හා ලබා ගන්නා ලද දිනයන් ............................................................

   ( රියදුරු සේවයේ I වන ශ්‍රේණියට උසස් කල දින සිට)
6. I. එම කාලය තුළ නිලධාරයා යම් විනයානුකූල දඬුවමකට (අවවාද කිරීමක් හැර) ලක්වී තිබේද? ..........................................................................................

   II. විනය ක්‍රියාමාර්ගයක් හෝ අධිකරණ ක්‍රියා මාර්ගයක් පිළිබඳ කටයුතු කරමින් පවතීද? ..........................................
7. සංස්ථාවක හෝ වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය සඳහා නිලධාරියා මුදාහැර සිටීනම් අදාල කාල වකවානුව පිළිබඳ විස්තර :- ............................................................................

   ........................................................................................................................................

මෙම නිලධාරියා සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇත / නැත. එබැවින් 2013.07.01 දින සිට විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම නිර්දේශ කරමි. / නොකරමි.

දිනය : ........................................... ආයතන ප්‍රධානියාගේ අත්සන :

නම :

පදවි නාමය :

(නිල මුද්‍රාව)

සටහන : ඉහත 1 සිට 7 දක්වා සුදුසුකම් සපුරා නොමැති නම් ඒවා සඳහන් කර එවන්න.

2013.07.01 දින සිට විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම නිර්දේශ කරමි. / නොකරමි.

දිනය : ........................................... අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන :

නම :

පදවි නාමය (නිල මුද්‍රාව) :